# දෙමළ උගත් අයට රැකියා අවස්ථා
## (දෙමළ ගුරු පත්වීම් හා වෙනත් රැකියා සඳහා)
## විද්‍යානුකූලව දෙමළ බස හදාරන්න

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය**

# දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව(ව්‍යාප්ත)
# 2026/2027 - (09) කණ්ඩායම

**පාඨමාලාව ආරම්භ කිරීම - 2026 අප්‍රේල්**

**කාල සීමාව : වසරකි.(ඉරිදා දින පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය මගින් පිරිනමන දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව ද්විතීය භාෂා අවශ්‍යතා ඉල්ලුම් කරන රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියා හා උසස් වීම් අපේක්ෂා කරන්නන් ඉලක්කගත කොට සැලසුම් කොට ඇත. එය නවීන විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රම භාවිත කරමින් අත්දැකීම් බහුල අපගේ ප්‍රවීන ආචාර්යවරුන් විසින් මෙහෙයවනු ලබයි.

## ඉලක්කගත පිරිස

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පාසල් හැර ගිය සිසුන්, රැකියා නියුක්තිකයින්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු ආරක්ෂක සේවාවන්හි නිරත වූවන්, සංචාරක ව්‍යාපාරයෙහි යෙදෙන්නන් සහ වෙළඳ ව්‍යාපාරකයින්, මාධ්‍යවේදීන් ආදී පිරිස් සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

## පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම්

1. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03 ක් පැරණි හෝ නව නිර්දේශය යටතේ එකවරකදි සමත් වී තිබීම **හෝ**
2. අ.පො.ස.(සා.පෙළ) විෂයයන් 6ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 03 ක් සහිතව සමත්වීම හා රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ වසර 02 ක සේවා පළපුරුද්ද **හෝ**
3. අ.පො.ස. (උ.පෙළ) හා අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයටද අයදුම්කල හැකිය. (විභාග ප්‍රතිඵල පසුව ඉදිරිපත් කල යුතුයි) **හෝ**
4. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයයේ හෝ වෙනත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයකින් වසරක දෙමළ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම **හෝ**
5. අධ්‍යයන මණ්ඩලය විසින් සලකා බලා විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම **හා**
6. විශ්වවිද්‍යාලය මඟින් පවත්වන තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

## පාඨමාලා ගාස්තු

අයදුම්පත් ගාස්තුව - රුː 500.00
පාඨමාලා ගාස්තුව,ලියාපදිංචි ගාස්තුව හා විභාග ගාස්තු-රුː 33,000.00
වාරික දෙකකින් ගෙවිය හැක.(23,000.00+10,000.00)

**අයදුම්පත් නිකුත් කිරීම හා භාර ගැනීම**
**2026 පෙබරවාරි 07 වැනි දින සිට මාර්තු 31 දක්වා**

මිහින්තලේ ලංකා බැංකු ශාඛාවේ "**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**" නමින් ඇති ගිණුම් අංක **5022233** ට රුː 500.00 මුදලක් ගෙවා ලබා ගත් රිසිට් පත (මනිඕඩර් හෝ චෙක්පත් භාරගනු නොලැබේ) සමඟ නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රය **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, බුලංකුලම්දිසා මාවත, II වන පියවර, අනුරාධපුරය.** ලිපිනය වෙත 2026 මාර්තු මස 31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයෙන් (CDCE) හෝ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් ද අවපතනය (Download) කළ හැකි ය.

**වැඩි විස්තර** - *025 2260120 - (CDCE),*
*වෙබ් අඩවිය* -www.rjt.ac.lk හෝ http://cdce.rjt.ac.lk/cdce/news.php

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ
2026.02.07